(164)

දෙපාර්තමේන්තු නියෝග 05 / 2017

මගේ අංක : පා/1/2/5/1
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.05. 23

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී/ අතිරේක අධ්‍යක්ෂවරුන්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

**<u>අධිවේගී මාර්ගවල ගමන් කිරීම වෙනුවෙන් ගෙවූ</u>**
**<u>ප්‍රවේශපත්‍ර ගාස්තු ප්‍රතිපූරණය කිරීම.</u>**

2017.02.17 දිනැති ව නිකුත් කරන ලද, උක්ත මැයෙන් යුත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2017 කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරනු ලැබේ. ඒ අනුව, සාමාන්‍ය දෛනික රාජකාරි නොවන විශේෂිත රාජකාරි සඳහා, යම් නිලධාරියෙකු අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ හෝ ගණන් දීමේ නිලධාරියාගේ පූර්ව අනුමැතිය ඇතිව අධිවේගී මාර්ගය භාවිතා කළ අවස්ථාවකදී, ඒ සඳහා භාවිත කළ වාහනය වෙනුවෙන් ගෙවූ ප්‍රවේශ ගාස්තුව හෝ සුඛෝපභෝගී බස් රථයක ගමන් කළ අවස්ථාවකදී, ඒ සඳහා වැය කළ ප්‍රවේශ පත්‍ර ගාස්තුව ප්‍රතිපූරණය කිරීමේ හැකියාව පවතී.

02. දෙපාර්තමේන්තුවෙහි විවිධ අධ්‍යක්ෂ අංශ වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව, අධිවේගී මාර්ග භාවිතය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2017 හි ඇතුලත් කොන්දේසි ප්‍රකාරව ගණන් දීමේ නිලධාරියා ගේ හෝ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා පහත දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතු බව දැනුවත් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කරනු ලබන අතර, ඒ අනුව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වනු ලැබේ.

03. සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, ප්‍රධාන ඉංජිනේරු, ප්‍රධාන ගණකාධිකාරි සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරු දරන නිලධාරීන් විසින් අධිවේගී මාර්ග භාවිතය සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

04. අනෙකුත් සියළුම නිලධාරීන් විසින් මේ සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ගේ ආවරණ අනුමැතියට යටත්ව අදාළ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර අප්‍රමාදව ආවරණ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය.

05. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි සියළු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආචාර්ය, ආර්.ඒම්.ඩබ්.ජී. විජේකෝන්.
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :

| | | |
|---|---|---|
| 01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. | - | කාරුණික දැන ගැනීමට. |
| 02. විගණකාධිපති. | - | එම |